තලවකැලේ ලිඳුල නගර සභාව
නුවරඑළිය දිස්ත්‍රික්කය
------------------------

1. මූල්‍ය ප්‍රකාශන
-----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
-----------------------------------

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 පෙබරවාරි 28 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 මැයි 21 දින ද විස්තරාත්මක කළමනාකරණ වාර්තාව 2020 ජුනි 18 දින ද සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය
----------------------------------

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට තලවාකැලේ ලිඳුල නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම
---------------------------------------------

(අ) ගිණුම්කරණ අඩුපාඩු
------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂය තුළ සහා අරමුදල් මඟින් ක්‍රියාත්මක කළ කර්මාන්ත 04 ක් සඳහා ගෙවිය යුතු රු.2,737,173 ක් විවිධ ණයහිමියන් මෙන්ම විවිධ ණයගැතියන් යටතේද ගිණුම්ගත කර තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. | අදහස් දක්වා නොමැත. |
| (ii) | සමාලෝචිත වර්ෂය තුළ ගබඩා භාණ්ඩ මිලදී ගැනීම් රු.8,176,642 ක් ජ'නල් සටහන් අංක 23 මඟින් පොදු ගබඩා ගිණුම හරකර ආදායම් වියදම් ගිණුමට බැරකර තිබීම නිසා වර්ෂයේ ආදායම එම වටිනාකමින් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දැක්වේ. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. | අදහස් දක්වා නොමැත. |
| (iii) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සභාව සතු බැංකු ගිණුම් 02 කට අදාළව පැවති අගරු චෙක්පත් වටිනාකම රු.742,107 ක් මුදල් ගිණුම බැර නොකර | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. | අදහස් දක්වා නොමැත. |

| | | | |
|---|---|---|---|
| | අගරු චෙක්පත් ගිණුම හරකර තිබුණි. | | |
| (iv) | රෝනියෝ යන්ත්‍රයක ඡායා පිටපත් යන්ත්‍රයක සහ ෆැක්ස් යන්ත්‍රයක වටිනාකම හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. | අදහස් දක්වා නොමැත. |
| (v) | ලංකා බැංකු ජංගම ගිණුමට සෘජුව බැර වී තිබුණු රු.80,407 ක් සහ බැංකුව විසින් අය කර තිබුණු බැංකු ගාස්තු රු.965 ක් ගිණුම්ගත කර නොතිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. | අදහස් දක්වා නොමැත. |
| (vi) | පෙර වර්ෂය අවසානයට ණයගැතියන් යටතේ ගිණුම්ගත නොකළ ඉඩම් හුවමාරු කිරීමේ මුද්දර ගාස්තු රු.952,500 ක් සමාලෝචිත වර්ෂය තුළ ලැබීමේදී සමුච්චිත අරමුදලට බැරකළ යුතු වුවද ලැබිය යුතු මුද්දර ගාස්තු ගිණුමට බැර කර තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. | අදහස් දක්වා නොමැත. |
| (vii) | සභාව සතු ට්‍රැක්ටර් රථයක වටිනාකම රු.1,463,200 ක් ගිණුම්ගතකර නොතිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. | අදහස් දක්වා නොමැත. |
| (viii) | සමාලෝචිත වර්ෂය අවසානයට පැවති කර්මාන්ත ණයගැති ශේෂය රු.9,000,169 ක් වුවද, එය රු.10,204,552 ක් ලෙස රු.1,204,383 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. | අදහස් දක්වා නොමැත. |
| (ix) | සමාලෝචිත වර්ෂය අවසානයට කර්මාන්ත ණයහිමි ශේෂය රු.10,773,311 ක් වුවද, එය රු.9,240,520 ක් ලෙස රු.1,532,791 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. | අදහස් දක්වා නොමැත. |

(ආ) නොසැසඳූ පාලන ගිණුම්

---------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පිළියෙල කර තිබුණු මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ 08 ක වටිනාකම හා එම ගිණුම් ශේෂවලට අදාළ උපයෝගී ලේඛනවල ශේෂ අතර රු.2,492,355 ක වෙනසක් තිබුණි. | වෙනස හඳුනාගෙන නිවැරදි කිරීමට කටයුතු කළ යුතු වේ. | අදහස් දක්වා නොමැත. |

(ඇ) ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්
-------------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (i) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වසර 02 සිට වසර 16 දක්වා කාල පරාසයක් ගතවී ඇති ගිණුම් විෂයන් 04 ක් යටතේ අයවිය යුතු රු.1,739,497 ක් අයකර නොතිබුණි. | ලැබිය යුතු ශේෂ අය කර ගැනීමට කටයුතු කළ යුතු වේ. | අදහස් දක්වා නොමැත. |
| (ii) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වසර 06 සිට වසර 08 දක්වා කාල පරාසයක් ගතවී ඇති රු.847,692 ක ගෙවිය යුතු ගිණුම් ශේෂ 07 ක් නිරවුල් කර නොතිබුණි. | ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වේ. | අදහස් දක්වා නොමැත. |

(ඈ) විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම
-----------------------------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| වටිනාකම රු.71,222,617 ක් වූ ගිණුම් විෂයයන් 02 ක් සහ වටිනාකම රු.4,414,837 ක් වූ ජ'නල් සටහන් 02 ක් උපලේඛන සහ වටිනාකම තහවුරු කෙරෙන සාක්ෂි ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය. | වටිනාකම සහිත නිවැරදි උපලේඛන පිළියෙල කර ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතු වේ. | අදහස් දක්වා නොමැත. |

1.4 අනුකූල නොවීම්
------------------

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම
------------------------------------------------------------------------------

| | නීති රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- | --- |
| (අ) | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(2) වගන්තිය | වාර්ෂික කාර්යසාධන වාර්තාව ඉදිරිපත් කර නොතිබුණි. | වාර්ෂික කාර්යසාධන වාර්තාව ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතු වේ. | අදහස් දක්වා නොමැත. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 189 හා 486 | අගරු චෙක්පත්වල වටිනාකම අයකර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | අදහස් දක්වා නොමැත. |

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.3,547,426 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.10,096,333 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2019 ඇස්තමේන්තුගත ආදායම | 2019 බිල්කළ ආදායම | 2019 රැස්කළ ආදායම | 2019 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | 2018 ඇස්තමේන්තුගත ආදායම | 2018 බිල්කළ ආදායම | 2018 රැස්කළ ආදායම | 2018 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 5,671,954 | 5,447,269 | 5,302,298 | 3,540,481 | 6,612,500 | 5,480,131 | 4,375,708 | 3,395,510 |
| කුලී | 8,413,423 | 7,338,353 | 7,894,782 | 1,633,653 | 7,529,289 | 9,071,720 | 7,499,718 | 5,716,044 |
| බලපත්‍ර ගාස්තු | 1,371,000 | 782,000 | 782,000 | - | 1,331,000 | 857,000 | 857,000 | - |
| වෙනත් ආදායම් | 16,198,524 | 6,685,996 | 6,731,388 | 3,159,170 | 10,631,986 | 1,675,917 | 1,626,429 | 8,919 |
| | 31,654,901 | 20,253,618 | 20,710,468 | 8,333,304 | 26,104,775 | 17,084,768 | 14,358,855 | 9,120,473 |

2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය ආරම්භයේදී පැවති හිඟ වරිපනම් බදු, ගෙවල් කුලී සහ බස් නැවතුම්පොළ ආපනශාලා කුලී අය කිරීම දුර්වල තත්ත්වයක පවතින අතර සමාලෝචිත වර්ෂයේ බිල්කළ ශාලා කුලී සහ බස් නැවතුම්පොළ ආපනශාලා කුලී අයවීමේ ප්‍රගතිය සතුටුදායක නොවීය. | හිග ආදායම් අය කර ගැනීමට කටයුතු කළ යුතු වේ. | අදහස් දක්වා නොමැත. |

2.2.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| උසාවි දඩ රු.2,854,826 ක් හා ඉඩම් හුවමාරු කිරීමේ මුද්දර ගාස්තු රු.167,000 ක් අයවිය යුතුව තිබුණි. | අදාළ මුදල් ලබාගැනීමට කටයුතු කළ යුතු වේ. | අදහස් දක්වා නොමැත. |

3. මෙහෙයුම් සමාලෝචනය

3.1. කාර්යසාධනය

නගර සභා ආඥා පනතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කාර්තවයන් ඉටුකිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

(අ) තිරසර සංවර්ධන ඉලක්ක

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක පිළිබඳව නගර සභාව ප්‍රමාණවත්ව දැනුවත්වී නොතිබුණු අතර, සමාලෝචිත වර්ෂය තුළදී ඒ සම්බන්ධයෙන් නිශ්චිත කාර්යයන් ඉටුකර නොතිබුණි. | තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක සපුරා ගැනීමට සැලසුම් සකස් කිරීමට කටයුතු කළ යුතු වේ. | අදහස් දක්වා නොමැත. |

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | සභාව සතු වනිගසේකර පෙදෙස අංක 86 දරන නිල නිවස වෙනුවෙන් 2019.12.31 දින වනවිට අයවිය යුතුව තිබූ රු.200,499 ක කුලී අයකරගෙන නොතිබුණි. | අදාළ නිහ කුලී අය කර ගැනීමට කටයුතු කළ යුතු වේ. | අදහස් දක්වා නොමැත. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සභාව විසින් පවත්වාගෙන යනු ලබන ඉඩම් බදු කුලී ලේඛනයේ සඳහන් බදුකරුවන් 11 දෙනෙකුගෙන් බදු කුලී අයකර නොතිබුණි. | බදුකරුවන් මේ වනවිටද ඉඩම් භුක්ති විඳිමින් සිටී නම් ගිවිසුම් අළුත් කරවාගෙන බදුකුලී අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | අදාළ බදුකරුවන් සම්බන්ධයෙන් විස්තර සොයාගත නොහැකි අතර ඔවුන් ගිවිසුම් අළුත් කරවාගෙන නොමැති බැවින් ගිවිසුම් අවලංගු වී ඇත. |
| (ඇ) | පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබාගත යුතු ස්වරූපයේ ව්‍යාපාර හඳුනා ගැනීම සඳහා සමීක්ෂණයක් සිදුකර නොතිබුණි. | සභාවට අයවිය යුතු බලපත්‍ර ගාස්තු අය කර ගැනීමට කළ යුතු වේ. | පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබාගත යුතු ව්‍යාපාර හඳුනාගෙන ඔවුන් වෙත ලිපි යවා ඇති අතර බලපත්‍ර ලබා නොගන්නේ නම් නීතිමය කටයුතු සිදු කරමි. |

3.3 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| තනතුරු 11 ක පැවති පුරප්පාඩු 30 ක් සම්පූර්ණ කර නොතිබුණි. | පුරප්පාඩු සම්පූර්ණ කරවා ගැනීමට කටයුතු කළ යුතු වේ. | අදහස් දක්වා නොමැත. |

3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | පළාත් පාලන කොමසාරිස්ගේ 2016 මාර්තු 17 දිනැති අංක මප/ප.පා.කො/2016/3 දරන චක්‍රලේඛය අනුව කඩ කාමර සඳහා තක්සේරු කරන ලද මාසික කුලිය වසර 05 කට වරක්වත් සංශෝධනය කළ යුතු වුවද සභාව සතු පොදු වෙළඳපළ පිහිටි කඩ කාමර 30 ක් සඳහා 2007 වර්ෂයට පසු කුලී තක්සේරුවක් සිදුකර නොතිබුණි. | චක්‍රලේඛයේ උපදෙස් පරිදි කටයුතු කළ යුතු වේ. | අදහස් දක්වා නොමැත. |
| (ආ) | 1988 මැයි 17 දිනැති අංක 1988/22 දරන පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛය අනුව පළාත් පාලන ආයතන විසින් වරිපනම් බදු අය කරන දේපළ වසර 05 කට වරක්වත් නැවත තක්සේරු | චක්‍රලේඛයේ උපදෙස් පරිදි කටයුතු කළ යුතු වේ. | අදහස් දක්වා නොමැත. |

කරවාගත යුතු වුවද, සභා බල ප්‍රදේශයේ වරිපනම් බදු අයකරන දේපළ 2011 වර්ෂයට පසු තක්සේරු කර නොතිබූ අතර 2011 වර්ෂයේ තක්සේරුව පදනම් කරගෙන වරිපනම් බදු අය කරමින් පැවතුණි.

3.5 වත්කම් කළමනාකරණය
-----------------------------

3.5.1 නිෂ්ක්‍රීය/ඌන උපයෝජිත වත්කම්
--------------------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | --------------------- | ------------ | -------------------------- |
| (අ) | පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යාංශයේ ප්‍රතිපාදන මත 2014 සහ 2015 වර්ෂවල රු.1,746,818 ක් වැයකර තලවාකැලේ වතු යායට අයත් ඉඩමක ඉදිකර තිබුණු මිඩ්ල්ටන් සංචාරක ගිමන්හල් ගොඩනැගිල්ල 2019 වර්ෂය සඳහා බදු දී තිබුණද ඉඩමේ අයිතිය පිළිබඳ ගැටළුව හේතුවෙන් බදුකරුට එය පවත්වාගෙන යාමට නොහැකි වී තිබුණ බැවින් ඉදිකිරීම සඳහා දරන ලද රු.1,746,818 ක වියදම නිශ්ඵල වියදමක් වී තිබුණි. | ඉඩමේ අයිතිය සම්බන්ධ ගැටළුව නිරාකරණය කරගෙන සභාවට ආදායමක් උපයා ගැනීමට කටයුතු කළ යුතු වේ. | අදහස් දක්වා නොමැත. |
| (ආ) | මිඩ්ල්ටන් ආහාර අළෙවි මධ්‍යස්ථානය 2019 වර්ෂයට බදු දුන් බදුකරුගෙන් 2019 දෙසැම්බර් 31 දිනට රු.44,358 ක මුදලක් අයවිය යුතු ලෙස ලේඛනවල සටහන් කර තිබුණ ද ඔහු විසින් ව්‍යාපාරය පවත්වාගෙන ගොස් තිබුණු බවට සාක්ෂි නොතිබුණු අතර මෙම ගොඩනැගිල්ල ද නිශ්කාර්යව පැවතුණි. | අදාළ වත්කම් ප්‍රශස්ථ ලෙස උපයෝජනය කර ගැනීමට කටයුතු කළ යුතු වේ. | අදහස් දක්වා නොමැත. |

3.5.2 වාහන උපයෝජනය

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | රු.6,180,000 ක් වැයකර 2010 වර්ෂයේදී මිලදීගන්නා ලද මයික්‍රෝ කැබ් රථය 2018 ජනවාරි සිට භාවිතයට නොගෙන නිශ්කාර්යව පැවතුණි. | අදාළ වත්කම් ප්‍රශස්ථ ලෙස උපයෝජනය කර ගැනීමට කටයුතු කළ යුතු වේ. | අදහස් දක්වා නොමැත. |
| (ආ) | සභාව සතු පොත් අගය රු.980,000 ක් වූ ඉසුසු වර්ගයේ ලොරි රථය 2018 පෙබරවාරි මස සිට ක්‍රියාවිරහිත වී තිබුණු අතර එය 2019 දෙසැම්බර් 31 දින වනවිට ද අළුත්වැඩියා කිරීමට කටයුතු නොකර නිශ්කාර්යව පැවතුණි. | අළුත්වැඩියා කර ප්‍රයෝජනයට ගැනීමට හෝ සුදුසු පරිදි අපහරණය කිරීමට කටයුතු කළ යුතු වේ. | අදහස් දක්වා නොමැත. |

3.6 ප්‍රසම්පදානය

කොන්ත්‍රාත් පරිපාලනය

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය තුළදී සහා අරමුදල් උපයෝගී කරගෙන සිදු කිරීමට නියමිතව තිබුණු රු.599,000 ක් වටිනා ඉදිකිරීම් දෙකක වැඩ කටයුතු සඳහා රු.103,789 ක අත්තිකාරම් මුදල් ලබාදී තිබුණ ද එම ඉදිකිරීම් කටයුතු 2020 ජනවාරි 20 දින වනවිට ද ආරම්භ කර නොතිබුණි. | කර්මාන්තය ඉටුකරවා ගැනීමට හෝ අත්තිකාරම් පියවා ගැනීමට කටයුතු කළ යුතු වේ. | අදහස් දක්වා නොමැත. |
| (ආ) | 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සහ චක්‍රලේඛයන්ට පටහැනි ලෙස තලවාකැලේ හේමචන්ද්‍ර මාවතට ඇස්පොල්ට් කොන්ක්‍රීට් යෙදීම සඳහා රු.4,000,000 ක ඇස්තමේන්තුවක් රු.2,000,000 බැගින් අදියර 2 ක් යටතේ ප්‍රජාපාදක සමිති දෙකකට ලබාදී තිබූ අතර මෙම අදාළ කොන්ත්‍රාත්තුව උප කොන්ත්‍රාත් ක්‍රමය මත සිදුකර තිබුණු බැවින් ප්‍රසම්පාදන කටයුතු සඳහා ප්‍රජාපාදක සංවිධාන සම්බන්ධ කර ගැනීමෙන් අපේක්ෂිත අරමුණු ඉටුවී නොතිබුණි. | ප්‍රසම්පාදන කටයුතු සඳහා ප්‍රජාපාදක සංවිධාන සම්බන්ධ කර ගැනීමේ අරමුණ ඉටුවන ආකාරයට කටයුතු කළ යුතු වේ. | අදහස් දක්වා නොමැත. |